306286

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

SRI LANKA ශ්‍රී ලංකා

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 9 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

306286

ශ්‍රී ලංකා SRI LANKA
19 APR

## 1998 අංක 9 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 30 වන දින]

එල්. ඩී.-ඕ. 75/95.

රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 9 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :— 437 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

> "රබර් වතු හා කුඩා රබර් ඉඩම් නැවත වගා කිරීම; රබර් වතු හා කුඩා රබර් ඉඩම් [illegible]රෝපනය කිරීම; අමු ස්වභාවික රබර් සකස් කිරීම සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම ඇතුළුව, අමු ස්වභාවික රබර් සකස් කිරීම; කුඩා රබර් ඉඩම් හිමියන්ට සුභසාධක පහසුකම් සැලසීම සඳහා සහනාධාර සැපයීමේ කාර්යය සඳහා අරමුදලක් පිහිටුවීමට සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "අමු රබර් සකස් කිරීමේ දී භාවිත කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම ඇතුළුව අමු රබර් සකස් කිරීම සඳහා ද වූ" යන වචන වෙනුවට, " අමු ස්වභාවික රබර් සකස් කිරීමේ දී භාවිත කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම ඇතුළුව අමු ස්වභාවික රබර් සකස් කිරීම සඳහා ද සහ කුඩා රබර් ඉඩම් හිමියන්ට සුභසාධක පහසුකම් සැලසීම සඳහා ද වූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ සහ 2ආ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ සහ 2ආ වගන්ති ඉවත් කිරීම.

2—D 045764—5,900 (97/09)

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියෙහි (1) වන උපවගන්තියෙහි —

(අ) එම උපවගන්තියෙහි (අ) සහ (ආ) ඡේද ඉවත් කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ඇ), (ඈ) සහ (ඉ) ඡේද, පිළිවෙලින් එම උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද වශයෙන් නැවත අකුරු යෙදීමෙන්:

(ඇ) එම උපවගන්තියේ නැවත අකුරු යෙදූ (ආ) ඡේදයෙහි "සියලු අපනයන බදු" යන වචන වෙනුවට "සෙස් බදු" යන වචන යෙදීමෙන්:

(ඈ) එම උපවගන්තියේ අලුතින් අකුරු යොදන ලද (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) අරමුදල සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල්" ; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි —

(අ) "අමු රබර් සකස් කිරීමේ දී භාවිත කරනු ලබන යන්ත්‍ර හා උපකරණ" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට, "අමු ස්වභාවික රබර් සකස් කිරීමේ දී යන්ත්‍ර හා උපකරණ භාවිත කරනු ලබන මිලට ගැනීම ඇතුළුව අමු ස්වභාවික රබර් සකස් කිරීම සඳහා ද කුඩා රබර් ඉඩම් හිමියන්ට සුභසාධක පහසුකම් සැලසීම සඳහා ද ගෙවිය යුතු බවට නියෝග මගින් බලය පවරා ඇති මුදල් ප්‍රමාණ" යන වචන ආදේශ කිරීමෙන්:

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "රජයේ අරමුදලට ගෙවිය යුතු මුදල් ප්‍රමාණ: සහ" යන වචන වෙනුවට, "රජයේ අරමුදලට ගෙවිය යුතු මුදල් ප්‍රමාණ:" යන වචන ආදේශ කිරීමෙන්:

(ඇ) එම උපවගන්තියේ (ඈ) ඡේදයේ "ගෙවිය හැකි පාරිශ්‍රමික මුදල්:" යන වචන වෙනුවට "ගෙවිය හැකි පාරිශ්‍රමික මුදල්: සහ " යන වචන ආදේශ කිරීමෙන්:

(ඈ) එම උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

(ඉ) රබර් වතු නැවත වගාකිරීම සඳහා මේ පනත යටතේ යම් සහනාධාර මුදලක් ලබා ගැනීමට හිමිකම් නොමැති තැනැත්තන්ට ප්‍රතිදානයක් වශයෙන් ගෙවිය යුතු බවට නියෝග මගින් බලය පවරනු ලැබුවා වූ මුදල් ප්‍රමාණ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන අමු ස්වභාවික රබර්වල සෑම කිලෝ ග්‍රෑම් එකක් සඳහා ම, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව වූ සෙස් බද්දක් පනවනු ලැබ අය කරනු ලැබ ගෙවනු ලැබිය යුතු ය.";

(2) එම උපවගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්ති ඉවත් කිරීමෙන්:

(3) එම වගන්තියේ (6) සහ (7) වන උපවගන්ති පිළිවෙලින් එම වගන්තියේ (2) සහ (3) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන්:

(4) එම වගන්තියේ නැවත අංක යෙදූ (2) වන උපවගන්තියේ "අපනයන බදු" යන වචන වෙනුවට "සෙස් බදු" යන වචන ආදේශ කිරීමෙන්:

(5) එම වගන්තියේ නැවත අංක යෙදූ (3) වන උපවගන්තියෙහි "අපනයන බදු" සහ "ප්‍රධාන රේගු අයකැමි" යන වචන වෙනුවට පිළිවෙලින් "සෙස් බදු" සහ "රේගු අධ්‍යක්ෂ ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන්:

(6) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:—

"අරමුදලට ආදායම සැපයීම සඳහා සෙස් බදු පැනවීම."

ප්‍රධා 3 ව සං.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි —

(අ) "අමු රබර් සකස් කිරීමේ දී භාවිත කරනු ලබන යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම ඇතුළුව" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "අමු ස්වභාවික රබර් සකස් කිරීමේ දී භාවිත කරනු ලබන යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම, ඇතුළුව අමු ස්වභාවික රබර් සකස් කිරීම සඳහා ද කුඩා රබර් ඉඩම් හිමියන්ට ප්‍රජාසාධක පහසුකම් සැලසීම සඳහා ද ඒ අරමුදලින් ආධාර මුදල් ගෙවීමේ යෝජනා ක්‍රමයක්" යන වචන ආදේශ කිරීමෙන්:

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "ගෙවිය යුතු මුදල තීරණය කිරීම" යන වචන වෙනුවට "ගෙවිය යුතු මුදල තීරණය කිරීම ; සහ" යන වචන ආදේශ කිරීමෙන්:

(ඇ) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඈ) සහනාධාර මුදල් ලැබීමට හිමිකම් නොමැති තැනැත්තන්ට ප්‍රතිදාන වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණ තීරණය කිරීම:" ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ —

(අ) (ආ) ඡේදයෙහි "රුපියල් එක් දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස හයකට වැඩි නොවන, කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ" යන වචන ආදේශ කිරීමෙන්: සහ

(3) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) එවැනි යම් යෝජනා ක්‍රමයක් යටතේ රබර් පාලක විසින් සහනාධාර වශයෙන් හෝ වගා කරන ද්‍රව්‍යවල, මිල හෝ පොහොරවල වියදම වශයෙන් ගෙවන ලද මුදල හෝ නොගෙවන ලද වෙනත් ආදාන, අධිකරණය විසින් පනවනු ලබන දඩයක ආකාරයට අයකර ගනු ලැබිය හැකි බවට සැලැස්විය හැකි අතර, සහනාධාර වාරික එකක් හෝ ඊට වැඩි ගණනක් ලබා ගැනීමෙන් පසු යම් තැනැත්තකු විසින් කුඩා රබර් ඉඩමක් අත්හැර දමනු ලැබූ බවටත් එම වාරික මුදල් ආපසු ගෙවනු ලැබ නොමැති බවටත් සඳහන් කරමින් රබර් පාලකවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් එම කරුණු ඔප්පු කිරීම සඳහා සාක්ෂි වශයෙන් ආවේශ්‍යා කර ගත යුතු බවට විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "අරමුදල" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

"තැනැත්තා" යන්නට පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ;

"අමු ස්වභාවික රබර්" යන්නෙන් එච්. එස්. ශීර්ෂයේ 40.01 ලෙස නො. 91/11 දරන රේගු නිවේදනයේ (ආර්. පී. බී.) යටතේ වර්ගීකරණය කරනු ලැබ 1991 ඔක්තෝබර් මස 1 වන දින අංක 682/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සියලු අමු ස්වභාවික රබර් වර්ග අදහස් වේ; සහ

(2) "රබර් පාලක" යන්නෙහි අර්ථ කථනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්:—

"රබර් පාලක" යන්නෙන් රබර් පාලන පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ බවට සලකනු ලබන හෝ රබර් පාලකවරයා අදහස් වන අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඊට ඇතුළත් වේ.".

✓ 03/01



අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

| සංශෝධනය | | | |
|---|---|---|---|
| ලේ | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

or affect any legal proceedings or remedy in respect of any such fine, penalty, forfeiture or punishment, and any such legal proceeding may be instituted, continued or enforced and such fine, penalty, forfeiture or punishment may be imposed as if this Act had not expired. [* Section 11 (Validating Provision) is omitted]

Interpretation. 13. In this Act, unless the context otherwise requires-

" appointed date " means the 5th day of October, 1953;

[6,4 of 1970] " approved crops " means such crops as may be approved for the purposes of this Act by the Minister by notification published in the Gazette;

" fund " means the Rubber Replanting Subsidy Fund established under this Act;

[8,9 of 1998] person " includes a body of persons ;

[8,9 of 1998] [3, 20 of 2006] " prescribed" means prescribed by regulation;

" regulation" means a regulation made under this Act;

[6, 4 of 1970] "rehabilitation" when used with reference to a rubber estate or rubber small holding means any operation designed to improve the agricultural conditions of such estate or small holding and includes the application of fertilizers, the adoption of improved agricultural practices and the planting of additional rubber plants and any other useful plants in such estate or small holding;

[6, Law 2 of 1977] " replanting "-

(a) when used with reference to any rubber estate or rubber small holding means the uprooting of all existing rubber plants and other vegetation in the whole or any part of such estate or small holding and the replacement with new rubber plants or with approved crops and includes the planting of rubber plants or approved crops in an area which does not form part of such estate or small holding if the rubber plants in an equivalent area of such estate or small holding are eradicated within such time as the Rubber Controller may specify; and

(b) when used with reference to any other land means the planting of such land with rubber for the first time;

[8,9 of 1998] Rubber Controller" means the Rubber Controller appointed or deemed to have been appointed under the Rubber Controller Act and include the Director-General of the Rubber Development Department

" Rubber Commissioner" means the Commissioner who purchases sheet rubber in Sri Lanka on behalf of the Government of Sri Lanka;

[6,4 of 1970] " rubber estate " means any rubber estate registered or deemed to have been registered under the Rubber Control Act;

" rubber plant " means a plant, tree, shrub or vine and includes any leaf, flower, seed, bud, twig, branch, root or any living portion of any plant, tree, shrub or vine which may be used to propagate any of the following:-

(a) Hevea Braziliensis (Para Rubber)

(b) Manihot Glaziovii (Ceara Rubber),

(c) Castilloa Elastica,

(d) Ficus Elastica (Rambong),

(e) any other plant, tree, shrub or vine which the Rubber Controller may by notification published in the Gazette declare to be a rubber plant for the purposes of this Act.